**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව - 2020**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ මිලටගත් හා පරිත්‍යාග ලෙස ලද පොත් වටිනාකම රු.544,702 ක් වුවද, එම අගය රු.3,186,731 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ආදායමෙන් ප්‍රාග්ධනයට දායක වීමේ ගිණුමේ ශේෂය රු.2,642,029 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ජනල් සටහනක් මඟින් නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ආ) | වර්ෂය තුළ මිලටගත් රු.791,435 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම නොවන වත්කම් හා ආදායමෙන් ප්‍රාග්ධනයට දායක වීමේ ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | ජනල් සටහනක් මගින් නිවැරදි කරන බව. | වර්ෂය තුළ මිලට ගන්නා ලද සියළුම ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කිරීමේදී මුද්දර බදු පාලන ගිණුම බැර කරමින් වෙනත් ආදායම් ගිණුමට හර කර තිබීම නිසා වර්ෂයේ මෙහෙයුම් ආදායම සහ ආදායම් ණයගැතියෝ රු.920,550 කින් අඩුවෙන් දැක්වුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී රු.19,178 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් ආදායම හා ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කරන බව. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඉදිරි වර්ෂය වෙනුවෙන් ලද රු.13,500 ක කසළ බදු හිඟ කසළ බදු ලෙස ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණු අතර ජංගම වගකීම් සමාන වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ජනල් සටහනක් මඟින් නිවැරදි කරන බව. | අදාළ ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. |
| (ඊ) | අංක 2247306 දරන ජංගම ගිණුමේ (පරිසර ලැබීම්) ශේෂය රු.877,683 ක් වුවත් එය රු.862,343 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු.15,340 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව. | ලෙජර් ගිණුම් ශේෂ නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.11,572,014 ක වෙනසක් නිරීක්ෂණය විය. | වැරදි නිවැරදි කිරිමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් ඊට අදාළ උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි (5)371 | 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අවස්ථා 23 කදී නිකුත් කර තිබුණු එකතුව රු.8,660,593 ක් වූ පුනරාවර්තන හා ප්‍රාග්ධන අත්තිකාරම් 2020 දෙසැම්බර් වනවිටත් පියවා නොතිබුණි. | මෙම අත්තිකාරම් එම කාල සීමා වලදීම පියවී ඇති නමුත් පොත්වල සටහන් නොවීම නිසා ඇතිවූ ශේෂයන් බවට නිගමනය කළ හැක. එබැවින් සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරමින් එම ශේෂ පොත් වලින් කපා හැරීමට කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.9,772,843 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,687,248 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | වසර 05 ට වඩා වැඩි කාලයක සිට හිඟහිට ඇති අක්කර බදු ශේෂය රු.116,142 ක් වුවද අක්කර බදු අය විය යුතු ඉඩම් පිළිබඳ සතොයක්ෂණයක් සිදුකර හිඟ බදු නිරවුල් කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ඉඩම් බෙදීයාම හේතුවෙන් අක්කර බදු අයකර ගැනීමේ ගැටළු මතුවී ඇති බැවින් දැනට පවතින ප්‍රමාණයන් තක්සේරු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කළ අතර එම නිර්දේශය අනුව ඉදිරියේදි කටයුතු කරන බව. | අක්කර බදු සතොයක්ෂණයක් සිදුකර අයවිය යුතු හිඟ බදු නිවැරදිව හඳුනාගත යුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළ හිඟ ජල ගාස්තු රු.6,835,186 ක් අයකර ගැනීම සඳහා සභාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සැලසුම් කළ පරිදි 2020 වර්ෂයේ දී හිඟ ජල ගාස්තු අයකර ගැනීමට නොහැකි විය. හිඟ අයකර ගැනීම සඳහා ඉදිරියේදී ජංගම සේවා පැවැත්වීමට කටයුතු සකස් කරමින් පවතින බව. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2020 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදයට අදාළව ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.3,207,550 ක් වූ අතර, 2020 මැයි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතු මුද්දර ගාස්තු 2021 පෙබරවාරි වන විටත් හඳුනාගෙන නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නියමිත කාලයේ දී මුද්දර ගාස්තු ලබා ගැනිම නොහැකි විය. ඉදිරියේදී අදාළ ගාස්තු අයකර ගැනිමට කටයුතු කරන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනවසර ඉදිකිරීම් පාලනය පළාත් පාලන ආයතනවල වගකීමක් වුවද එවැනි ඉදිකිරීම් හඳුනාගැනීමක් සිදුකර නොතිබුණු අතර, 2016 සිට 2020 නොවැම්බර් 30 දක්වා අනවසර ඉදිකිරීම් පිළිබඳව ලද මහජන නියෝජන 10 කින් 05 ක් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. | ඇළ,දොළ ගංගා අසල අනවසරව ඉදිකර ඇති ගොඩනැගිලි සම්බන්ධව කටයුතු කිරිමට යාමේ දී ඉඩම් හිමියන් ගේ භුක්තිය තහවුරු කිරිම සඳහා ඇති ලේඛන වල ඉඩමේ මායිම ලෙස ඇළ, දොළ, ගංගා දක්වා තිබිම නිසා නිතිමය ගැටලු මතු වන බැවින් රක්ෂිතය සඳහා නිශ්චිත භූමි ප්‍රමාණයක් තබා මැනුම් කටයුතු සිදු කිරිම සුදුසු බවට අදාළ ආයතන දැනුවත් කර ඇති බව. | අනවසර ඉදිකිරීම් පාලනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුරනැගුම ව්‍යාපෘතිය මඟින් රු.42,000,000 ක් වැය කර 2016 අගෝස්තු මස සභාව වෙත ඉදිකර භාර දෙන ලද ගලගම බහු කාර්ය ගොඩනැගිල්ල අදාළ කටයුතුවලට යොදා නොගෙන වර්ෂ 04 ක කාල පරිච්ඡේදයක සිට නිෂ්කාර්යයව පැවතුණි. 2020 අයවැය ඇස්තමේන්තුව අනුව එම ගොඩනැගිල්ලෙහි සූර්ය බල ශක්ති පද්ධතියක් සවිකිරීමට සැලසුම් කර තිබුණද, 2020 දෙසැම්බර් වනවිටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | පුරනැගුම ව්‍යාපෘතිය මඟින් ඉදිකරන ලද ගලගම බහුකාර්ය ගොඩනැගිල්ල අදායම් උත්පාදනයට යොදා ගැනිම සඳහා සෝලා පද්ධතියක් මේ වන විට සවිකර ඇති අතර, එමගින් නිපදවන විදුලිය ලංකා විදුලි බල මණ්ඩල වෙත ලබාදීමට කටයුතු කරමින් පවතින බව. | බහුකාර්යය ගොඩනැගිල්ල ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.3 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පඹහින්න සතිපොළ සංවර්ධනය සඳහා 2015 සහ 2017 වර්ෂයන්හිදී රු.4,561,397 ක් වැයකර තිබුණ ද, පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධන කටයුතු සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ද අදාළ අරමුණු කරා ළඟාවීමට සභාව අපොහොසත් වී තිබුණි. | මෙම පොළ භූමියේ ඉතිරි වැඩ නිම කිරිම සඳහා 2018 වර්ෂයේ දී පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඇස්තමේන්තු අනුමැතියට යවා ඇති අතර, මුදල් ප්‍රතිපාදන ලැබුණු පසු සතිපොළ වෙළඳුන්ට පරිහරනය කළ හැකි පරිදි සකස් කිරිමට කටයුතු කරන බව. | ප්‍රතිපාදන සපයා ගෙන පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධනය කළ යුතු වේ. |